**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 01/93**

මගේ අංකය : 0266/2/68/එල්/ඒ IX වෙළුම
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993 ජනවාරි මස 25 වෙනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුවේ ඒජන්තවරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 1993**

පහත සඳහන් රජයේ නිලධරයන්ට, 1993 වර්ෂයේ රු. 1000/- කට නොවැඩි වන විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට තීරණය කර ඇත.

(අ) මාණ්ඩලික ශ්‍රේණි වලට අයත් නොවන රජයේ සියළුම ස්ථිර නිලධරයෝ විශේෂ අත්තිකාරම් ලැබීම සඳහා සුදුස්සෝ වෙති. මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙක් යනු නව ආරම්භක වාර්ෂික වැටුප රු. 27,000/- ක් වූ හෝ ඊට වැඩිවූත් වාර්ෂික වැටුප් වර්ධකය රු. 600/- ක් හෝ ඊට වැඩිවූත් රජයේ නිලධරයෙකි.

(ආ) අත්තිකරම් ගෙවීමේ දිනට පූර්වාසන්නයේ තුන් මසකට නොඅඩු කාලයක අඛණ්ඩ සේවාවක් ඇත්තාවූද, ණය මුදල් ආපසු අයකර ගත යුතු සම්පූර්ණ කාලසීමාව තුලදී ( එනම් අඩු වශයෙන් 1993 දෙසැම්බර් අවසාන දක්වා ) අඛණ්ඩ සේවයේ යෙදවීමට නිශ්චිත වශයෙන් අවකාශ අත්තාවූද, මාණ්ඩලික නොවන තාවකාලික හෝ අනියම් පදනමක් මත සේවය කරන නිලධරයෝද මෙම අත්තිකාරම් ලැබීමට සුදුස්සෝ වෙති.

(ඇ) තාවකාලික හා අනියම් සේවකයන් සඳහා මෙම අත්තිකාරම් මුදල ගෙවන්නේ නම් ස්ථිර සේවක ඇපකරුවෙකු ලබා ගත යුතුය.

02. 1977 වර්ෂයේ සිට 1992 වර්ෂය දක්වා ලිත් වර්ෂයන්හි ලබාගත් යම් විශේෂ බැංකු ණය / විශේෂ අත්තිකාරම් මුදල් කොටස් ගෙවීම පැහැර හැර ඇති යම් කිසි පුද්ගලයෙකුට 1993 වර්ෂයේ දෙනු ලබන විශේෂ අත්තිකාරම් මුදල ලැබීමට හිමිකම් නොමැත.

03. මෙම අත්තිකාරම් ගෙවීම 1993.01.01 වන දින පටන් ගෙන 1993.02.28 දිනෙන් අවසන් කල යුතුය. 1993.02..28 වන දිනට පසු ගෙවීම් නොකල යුතුය.

04. මෙම අත්තිකාරම් මුදල් "රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් මුදල් - 'බී' ගිණුමට" හර කළ යුතුය.

05. මෙම අත්තිකාරම් මුදල් සමාන මාසික කොටස් දහයකින් 14% බැගින් වූ සමාන මාසික පොලියද සහිතව අයකර ගත යුතුය. රු. 1000/- අත්තිකාරම් මුදල සඳහා මාසිකව අය කෙරෙන සමාන මාසික පොලිය රු.6.42 කි. රු.1000/- ට අඩු අත්තිකාරම් මුදල් සඳහා සමානුපාතික මාසික පොලියක් අයකළ යුතුය.

06. මෙම අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් අඩුකර ගැනීම් ආයතන සංග්‍රහයෙහි XXIV පරිච්ඡේදයේ 3 වගන්තියේ සහ අංක 238 වැනි මුදල් රෙගුලාසියෙහි සඳහන් වන 33 1/3% හෝ 40% සීමාවෙන් නිදහස්ය.

07. අයකර ගනු ලබන මූලික මුදලේ කොටස් මෙම අත්තිකාරම් ගෙවනු ලබන "රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් මුදල් - බී ගිණුමට" බැර කළ යුතුය. අයකර ගනු ලබන පොලිය ආදායම් ශීර්ෂ 5, ලැබුණු බදු කුලී, පොලී හා ලාභාංශ, උප ශීර්ෂ 2 පොලී විෂය 4 - අනිකුත් යන ආදායම් ශීර්ෂයට වෙනම බැර කළ යුතුය. අයකර ගැනීම් 1993.12.31 වන දිනට අවසන් විය යුතුය.

08. මෙම අයකර ගැනීම් "රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමෙන්" ගෙවනු ලබන උත්සව අත්තිකාරම් හෝ වෙනත් අත්තිකාරම් සමග හෝ 1977, 78, 79 වර්ෂයන්හිදී දෙන ලද විශේෂ බැංකු ණය සමග මිශ්‍ර කර නොගත යුතුය.

09. ගෙවීම් මූලික මුදලේ කොටස් අයකර ගැනීම් සහ සමාන මාසික පොලිය අයකර ගැනීමේ සටහන් කර ගැනීම සඳහා සී.සී. 10 පොදු ආකෘතියේ වෙනම ලේඛණයක් පවත්වාගෙන යා යුතුය.

10. අත්තිකාරම් ගිණුමේ සීමාවන් සංශෝධනය කිරීම අවශ්‍ය වූ විට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් මු.රෙ. 503 හා 1987.09.11 දිනැති රාජ්‍ය ව්‍යාපාර අංශයේ චක්‍රලේඛ ලිපි අංක 43 අනුව ක්‍රියා කළ යුතුය.

11. මෙම විශේෂ අත්තිකාරම් මුදල ගෙවීමේ හේතුවෙන් 1993 දී විශේෂ බැංකු ණය ගෙවනු නොලැබේ.

12. පිටතට මාරු වී යන නිලධරයෙකු සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුමෙන් දෙනු ලබන අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමේ සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියා පරිපාටිය අනුගමනය කළ යුතුය. එනම් අත්තිකාරම් මුදලේ ආපසු ගෙවීමට ඇති ශේෂය, "රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් - 'බී' ගිණුමට" හර කරමින්, නිලධරයා ලබා ගන්නා දෙපාර්තමේන්තුව විසින් නිලධරයා මුදහරින දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය. ඉන්පසුව ණය වාරික කොටස් දිගටම අයකර ගත යුතු අතර, කෙසේ හෝ 1993 දෙසැම්බර් මස අවසන් වන විට සම්පූර්ණ අත්තිකාරම් මුදල අයකර ගැනීමට වගබලා ගත යුතුය.

13. මෙම ක්‍රමය යටතේ අත්තිකාරම් මුදල් ලබාගත් යම් නිලධාරියෙකුගේ සේවය අවසන් කළහොත් ඔහුගෙන් අයවීමට ඇති අත්තිකාරම් මුදල් ශේෂ (සමාන පොලියක් සමග) ඔහුගේ විශ්‍රාම වැටුපෙන් / අර්ථ සාධක අරමුදලෙන් / ඇප මුදලෙන් / පාරිතෝෂිකයෙන් හෝ ඔහුට ගෙවීමට ඇති වෙනත් මුදලකින්ද, තාවකාලික නිලධරයෙකු වන්නේ නම්, ඔහුගේ අවසන් මාසික වැටුපෙන්ද අයකර ගැනීමට ගෙවීම් සහ ආයතන ඒකක වගබලාගතයුතුය.

14. මෙම අත්තිකාරම් ගෙවනු ලබන්නේ අංක 293 හා 1985.06.03 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යටතේ ගෙවනු ලබන ණය / අත්තිකාරම් වලට අමතරවය.

15. අංක 268 හා 1984.09.25 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමුණා තිබූ ආදර්ශ ඉල්ලුම් පත්‍රය අවශ්‍ය පරිදි සංශෝධනය කොට මෙම අත්තිකාරම් සඳහා ඉල්ලුම් පත්‍ර ගෙවීම් බලධාරියා සකස් කළ යුතුය.

16. කරුණාකර මෙම චක්‍රලේඛයෙහි අඩංගු වන කරුණු ඔබ දෙපාර්තමේන්තුවේ සියළුම සුදුසුකම් ලබන නිලධරයන්ට දැන ගැනීමට සලස්වන්න.

17. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලදී.

අ,කලේ. / ඩබ්ලිව්.පී.එස්. ජයවර්ධන
ආයතන අධ්‍යක්ෂ